
# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


**2022 පෙබරවාරි**
**04 වෙළුම 02 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2022 වසරේ පෙබරවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,092ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 14.7කින් ඉහළ ගියේය.

2022 වසරේ පෙබරවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,873ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 22.9කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 16.1කින් සහ සියයට 23.0කින් ඉහළ ගියේය.

වෙළඳ ශේෂයේ හිඟය, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 572ට සාපේක්ෂව, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 781ක් දක්වා වැඩි විය.


## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජන.-පෙබ.)

අපනයන (එ.ජ. ඩොලර් මිලියන) | ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.-පෙබ.)




### අපනයන පරිමා හා මිල දර්ශක (ජන.-පෙබ.)





2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගිය අතර, කෘෂිකාර්මික, ඛනිජමය හා වෙනත් අපනයන සුළු වශයෙන් ඉහළ ගියේය.


2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී, අපනයන පරිමා දර්ශකය සහ මිල දර්ශකය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 15.8කින් සහ සියයට 0.3කින් ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-පෙබ.)





### තේ සහ රබර් මිල ගණන් *





මුහුදු ආහාර, පොල්, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ රබර් අපනයන ආදායම ඉහළ යන අතර තේ, කුළුබඩු සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම පහත වැටීම හේතුවෙන්, 2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව බොහෝදුරට සමාන මට්ටමක පැවතිණි.

## කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-පෙබ.)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජතෙල් නිෂ්පාදිත, මූල ලෝහ හා උපාංග, සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. මේ අතර, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත සහ පිහන් මැටි නිෂ්පාදිත අපනයන ද සුළු වශයෙන් ඉහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-පෙබ.)





### ආනයන පරිමා හා මිල දර්ශකය (ජන. -පෙබ.)





සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී ආනයන පරිමා දර්ශකය සහ මිල දර්ශකය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 4.3කින් සහ සියයට 18.0කින් ඉහළ ගියේය.

## පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. -පෙබ.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන්, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් සහල්), බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, රෙදිපිළි හා උපාංග සහ කුළුබඩු ඇතුළු ආහාර හා පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන කාණ්ඩ දෙකෙහිම වැඩිවීම හේතුවෙන් 2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. විදුලි සංදේශ මෙවලම්, සීනි හා රසකැවිලි සහ තෙල් හා මේද, ආනයන වියදම් පහළ ගිය කාණ්ඩ අතරට අයත් වේ.


## අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම




### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක












*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල බොරතෙල් ආනයනය කර නැත.

ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, මූල ලෝහ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී ආහාර සැකසුම්, පොහොර, කෘෂිකාර්මික යෙදවුම් සහ තිරිඟු ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන




ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | පෙබ.- 2021 | පෙබ. - 2022 | වෙනස (%) | ජන. -පෙබ. 2021 | ජන.-පෙබ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **206.5** | **202.1** | **-2.1** | **406.5** | **406.6** | **0.03** |
| එයින් | තේ | 112.5 | 100.9 | -10.4 | 213.5 | 192.1 | -10.0 |
| | පොල් | 30.9 | 34.7 | 12.2 | 55.1 | 68.0 | 23.5 |
| | කුළුබඩු | 33.1 | 27.1 | -18.3 | 75.2 | 62.1 | -17.4 |
| | මුහුදු ආහාර | 14.1 | 21.2 | 50.5 | 31.0 | 45.3 | 46.2 |
| **කාර්මික අපනයන** | | **740.3** | **883.7** | **19.4** | **1,472.6** | **1,773.9** | **20.5** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 443.3 | 496.4 | 12.0 | 866.3 | 1,012.5 | 16.9 |
| | රබර් නිෂ්පාදිත | 81.0 | 88.3 | 9.1 | 161.2 | 170.3 | 5.7 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 22.7 | 56.8 | 150.6 | 57.1 | 124.0 | 117.2 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 41.7 | 50.4 | 21.0 | 81.4 | 92.1 | 13.2 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 39.6 | 44.8 | 13.2 | 80.7 | 89.5 | 10.8 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 19.7 | 25.2 | 28.0 | 43.1 | 55.3 | 28.5 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 4.5 | 5.9 | 31.4 | 7.9 | 10.1 | 27.4 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **4.9** | **5.8** | **17.9** | **9.3** | **11.9** | **27.7** |
| **මුළු අපනයන** | | **951.7** | **1,091.6** | **14.7** | **1,888.4** | **2,192.4** | **16.1** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | පෙබ.- 2021 | පෙබ. - 2022 | වෙනස (%) | ජන. -පෙබ. 2021 | ජන.-පෙබ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **272.7** | **298.8** | **9.5** | **618.3** | **658.8** | **6.5** |
| **ආහාර හා පාන වර්ග** | | 131.8 | 161.4 | 22.5 | 315.6 | 348.6 | 10.5 |
| එයින් | එළවළු (ආ) | 27.2 | 33.0 | 21.2 | 67.6 | 62.6 | -7.5 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 140.9 | 137.3 | -2.5 | 302.7 | 310.2 | 2.5 |
| එයින් | පෞද්ගලික රථවාහන | 0.9 | 0.7 | -23.2 | 1.4 | 1.4 | -2.7 |
| **අන්තර් භාණ්ඩ** | | **945.9** | **1,219.8** | **29.0** | **1,860.8** | **2,432.3** | **30.7** |
| එයින් | ඉන්ධන | 320.2 | 462.2 | 44.4 | 630.0 | 892.5 | 41.7 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 222.8 | 323.1 | 45.1 | 459.2 | 639.7 | 39.3 |
| | පොහොර | 14.0 | 4.2 | -70.2 | 18.7 | 6.7 | -64.4 |
| | තිරිඟු හා ඉරිඟු | 55.5 | 15.8 | -71.5 | 62.4 | 57.5 | -7.8 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **305.0** | **354.4** | **16.2** | **636.1** | **741.2** | **16.5** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 193.8 | 224.3 | 15.7 | 410.5 | 468.1 | 14.0 |
| **මුළු ආනයන** | | **1,523.6** | **1,872.9** | **22.9** | **3,115.2** | **3,832.3** | **23.0** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | පෙබ.- 2021 | පෙබ. - 2022 | වෙනස (%) | ජන. -පෙබ. 2021 | ජන.-පෙබ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -571.9 | -781.4 | | -1,226.8 | -1,639.9 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | පෙබ.- 2021 | පෙබ. - 2022 | වෙනස (%) | ජන. -පෙබ. 2021 | ජන.-පෙබ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 132.5 | 151.9 | 14.7 | 131.4 | 152.6 | 16.1 |
| | පරිමා දර්ශකය | 130.7 | 145.4 | 11.2 | 135.2 | 156.5 | 15.8 |
| | මිල දර්ශකය | 101.3 | 104.5 | 3.1 | 97.2 | 97.5 | 0.3 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 136.4 | 167.6 | 22.9 | 139.4 | 171.5 | 23.0 |
| | පරිමා දර්ශකය | 151.4 | 161.1 | 6.4 | 158.6 | 165.4 | 4.3 |
| | මිල දර්ශකය | 90.1 | 104.0 | 15.5 | 87.9 | 103.7 | 18.0 |
| **වෙළඳ මිල අනුපාතය** | | 112.5 | 100.5 | -10.7 | 110.6 | 94.0 | -15.0 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද